# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2288/29 - 2022 ජූලි මස 15 වැනි සිකුරාදා - 2022.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ජනා.කා. අංකය : පීඑස්/සීඑස්ඒ/00/1

### ප්‍රකාශනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38(1)(ආ) ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වර්ෂ දෙදහස් විසිදෙකක් වූ ජූලි මස දහහතර වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ජනාධිපති ධූරයෙන් ඉල්ලා අස්වී ඇති හෙයින් ද,

එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් එහි මන්ත්‍රීවරයන් අතුරෙන් ජනාධිපති ධූරයට තෝරා පත්කර ගනු ලැබීමට සුදුසුකම් ඇති යම් මන්ත්‍රීවරයෙකු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු හෙයින් ද,

එලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් නව ජනාධිපතිවරයෙකු තෝරා පත්කර ගනු ලබන තෙක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා, වර්ෂ දෙදහස් විසිදෙකක් වූ ජූලි මස පහළොස් වැනි දින, එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157අ(7) ව්‍යවස්ථාව සමග කියවනු ලබන 32 (1) ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති ආකාරයට එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතරවැනි හා හත්වැනි උපලේඛනවල දැක්වෙන ප්‍රතිඥාවන් දී ඊට අත්සන් තැබීමෙන් එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(ඇ) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරයෙහි වැඩබැලීමෙහි කාර්ය හා කර්තව්‍ය භාර ගත් වග මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ බව සියළු දෙනාම මෙයින් දැන ගත යුතුය.

වර්ෂ දෙදහස් විසි දෙකක් වූ ජූලි මස පහළොස් වැනි දින කොළඹ දී දෙන ලදී.

ගාමිණී සෙනරත්,
ජනාධිපති ලේකම්.

2022 ජූලි මස 15 වන දින.
කොළඹ - 01.

1A - G 37079 — 366 (2022/07)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*